ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2018 නොවැම්බර් 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 ඔක්තෝබර්

### නිෂ්පාදන ක්‍රියාකාරකම් වර්ධනය විය

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින් 2018 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි.


ඔක්තෝබර් මාසයෙහි දක්නට ලැබුණු මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම, උත්සව සමයෙහි ආහාර සහ පාන නිෂ්පාදනය සඳහා ඇතිවන ඉල්ලුම හේතුවෙන්, නව ඇණවුම් සහ නිෂ්පාදනවල දක්නට ලැබුණු වර්ධනය හේතු විය. ආහාර සහ පාන අංශයෙහි සේවා නියුක්තිය, සෘතුමය ප්‍රවණතා හේතුවෙන් යම් වර්ධනයක් පෙන්නුම් කළද, සමස්ත සේවා නියුක්තියෙහි අඩු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සේවකයන් සොයාගැනීමේ අපහසුතාවය හේතුවෙන්, රෙදිපිළි සහ නිමි ඇඳුම් නිෂ්පාදන අංශයෙහි සේවා නියුක්තියෙහි දක්නට ලැබුණු අඩු වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

| විචලයය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.1** | **58.2** | **+** | **වැඩි වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| **නව ඇණවුම්** | 53.0 | 59.0 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **නිෂ්පාදන** | 53.5 | 61.0 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **සේවා නියුක්තිය** | 55.5 | 55.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| **ගැනුම් තොගය** | 56.0 | 61.0 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය** | 54.0 | 54.0 | = | සම වේගයකින්, ඉහළ |

ඉදිරියේදී උත්සව සමයත් සමඟ ඇතිවන ඉල්ලුම හේතුවෙන් ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත අංශය තොග රඳවා ගැනීම ගැනුම් තොග ඉහළ යාම තුළින් පිළිඹිබු විය. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාම තුළින් සාමාන්‍යයෙන් පිළිඹිබු වනුයේ කෙටිකාලීනව ආර්ථිකය වර්ධනය වන බවකි. එනමුත්, මෙම මස තුළ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයෙහි වාර්තා කළ වර්ධන වේගයම පෙන්නුම් කරන ලද්දේ, අමුද්‍රව්‍යය වල පැවති හිඟයත්, නිෂ්පාදකයන් විසින් රුපියල ස්ථාවර වීම මඟින් අමුද්‍රව්‍යය මිල මට්ටම් තවදුරටත් ඉහළ යාම පාලනය වේ යැයි බලාපොරොත්තුවෙන් සැපයුම් ලබාගැනීමට වැඩි කාලයක් ගත කිරීමත් හේතුවෙනි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**
**58.2**
**සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක 4.1 ක වැඩිවීමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක අගයන් 0.1 කින් පහත වැටෙමින් ඔක්තෝබර් මාසයේ දී 52.1 ක දර්ශක අගයක් වාර්තා කළ අතර, මෙමඟින් ගෝලීය නිෂ්පාදනයෙහි යම් පසුබෑමක් පෙන්නුම් කරන ලදී.

යුරෝපා කලාපය සහ එක්සත් රාජධානියෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකයන්හි ද යම් අඩුවීමක් පෙන්නුම් කළ අතර, එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ රුසියාව යන රටවල යම් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2018 නොවැම්බර් 13 වන දිනට)*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

## ඔක්තෝබර් මාසයේ දී සේවා අංශය ඉහළ වේගයකින් වර්ධනය විය

ව්‍යාපාර ක්‍රියාකාරකම්, අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ නව ව්‍යාපාරවල සිදු වූ ඉහළ යෑම හේතුවෙන් ඔක්තෝබර් මාසයේ දී සේවා අංශය ඉහළ වේගයකින් වර්ධනය විය.


ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සහ ප්‍රවාහන හා ගබඩා කිරීම් යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දැකිය හැකි විය. කෙසේ වුවද, රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සිදු වූ ආනයන පරිමාවල අඩුවීම ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය කෙරෙහි අහිතකරව බලපෑ බව ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කර තිබුණි. එමෙන්ම, මූල්‍ය සේවා සහ වෘත්තීය සේවා යන උප අංශවල නව ව්‍යාපාර ද වර්ධනය විය. ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ වර්ධනය හේතුවෙන් සේවා නියුක්ති මට්ටම වැඩි වේගයකින් ඉහළ යන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.5**

**සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක 2.5 ක වැඩිවීමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **53.0** | **55.5** | **+** | **වැඩි වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 55.2 | 58.2 | + | වැඩි වේගයකින්, ඉහළ |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 51.0 | 57.1 | + | වැඩි වේගයකින්, ඉහළ |
| සේවා නියුක්තිය | 54.2 | 55.4 | + | වැඩි වේගයකින්, ඉහළ |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.0 | 43.1 | - | වැඩි වේගයකින්, පහළ |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.6 | 63.6 | + | වැඩි වේගයකින්, ඉහළ |

2018 ඔක්තෝබර් මාසයේ දී සේවා සපයන්නන්ගේ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අපේක්ෂා වර්ධනය වීම සඳහා එම කාලසීමාව උත්සව සමයක් වීමත් සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන කාලසීමාවක් වීමත් ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, වර්තමාන දේශපාලන තත්ත්වය සහ රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ඉහත අපේක්ෂාවන් සපුරා ගැනීම සීමා වීමට ඉඩ ඇති බව ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කර තිබුණි.

සේවා අංශයේ අයකරන මිල ගණන් වැඩි වේගයකින් ඉහළ ගිය අතර ප්‍රසාද දීමනා ගෙවීම් හේතුවෙන් ඔක්තෝබර් මාසය තුල දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය

සිව් මසකට පසු පළමු වරට ඔක්තෝබර් මාසයේ දී ගෝලීය සේවා අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ බව දැකිය හැකි විය. ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වසර දෙකකින් වාර්තා වූ පහළම අගය වන සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ 52.9 හි සිට ඔක්තෝබර් මාසයේ දී 53.4 දක්වා ඉහළ ගිය අතර අඛණ්ඩව මාස 111 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල අඩු වීමක් වාර්තා වූ සමීක්ෂණය මගින් ආවරණය වන එකම රට ඉතාලිය විය. අයර්ලන්තය සහ රුසියාව යන රටවල ඉහළම වර්ධන වේගයන් දැකිය හැකි විය.

ජපානය, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2018 නොවැම්බර් 13 වන දිනට)*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.